සැ.යු.: 2025.09.12 දින පළ කරන ලද අංක 2454 *ගැසට්* පත්‍රයේ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,455 - 2025 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.09.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය … | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය … | 992 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| වෙනත් පත්කිරීම් ආදිය … … … … … … | 993 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය … … … … … | — |
| රජයේ නිවේදන … … … … | 995 |
| මිල පාලන දැන්වීම් … … … … | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් … … … … | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන … … … … | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා … … … … | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් … … … … | 1000 |
| නැවියන්ට දැන්වීම් … … … … | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් … … … … | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 10 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2025 අංක 595

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එම්. ප්‍රදීපන් මහතා 2024 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින.

09 - 164/1

---

2025 අංක 596

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි චාමින්ද හෙට්ටිආරච්චි මහතා 2025 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින.

09 - 164/2

---

2025 අංක 597

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි කමල් අමරසිංහ මහතා 2025 අප්‍රේල් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින.

09 - 164/3

---

2025 අංක 598

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එල්. පී. මදනායක මහතා 2025 ජුනි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින.

09 - 164/4

---

2025 අංක 599

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි සමන්ති රණසිංහ මහත්මිය 2025 ජූලි මස 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සිය නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ආයුර්වේද කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින.

09 - 164/5

# වෙනත් පත්කිරීම් ආදිය

2025 අංක 600

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය**

නිලධාරීන්ගේ උසස් කිරීම්

*2024 ඔක්තෝබර් මස 30 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් අකුණුගේ හෙලන් ඈන් රුක්ෂානි නිමල්රත්න, එන්ආර්එම් 3988, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් හේවාවසම් ගොඩැල්ලගේ සමාධී අරුණෝදා, එන්ආර්එම් 3989, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් කපුගම ගීගනගේ ධනුෂා, එන්ආර්එම් 3990, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් කවීෂා එරාජිනී ඩිල්ෂාරා ගමගේ, එන්ආර්එම් 4098, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් බමුණාවිට ගමගේ දෙන් දසුනි දේවින්දී ජීරසිංහ, එන්ආර්එම් 4095, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් සහනි මුදරා මාටිල්, එන්ආර්එම් 4096, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් වක්වැල්ල කංකානම්ගේ පවන් මදූෂාන්, එන්ආර්එම් 4090, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් හතරසිංහ ලියනගේ ප්‍රියංකා, එන්ආර්එම් 4097, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් මධුක ප්‍රභාෂ් රත්නසේකර, එන්ආර්එම් 4092, ශ්‍රීලංනාහ.

*2022 නොවැම්බර් මස 11 වැනි දින සිට වැඩ බලන ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් පොන්වීර ආරච්චිගේ දෙන් ෂහේන් මාරියෝ දීපාල් අප්පුහාමි, එන්ආර්එක්ස් 4234, ශ්‍රීලංනාහ;

*2023 නොවැම්බර් මස 10 වැනි දින සිට වැඩ බලන ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් මාන්නගේ මලීෂ අශේන්, එන්ආර්එක්ස් 4226, ශ්‍රීලංනාහ;

*2025 පෙබරවාරි මස 19 වැනි දින සිට වැඩ බලන ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් ඉලංදාරි දේවගේ ළහිරු සාරංග මධුවාස, එන්ආර්එක්ස් 4498, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් මඩවල මද්දුමගේ ෂේන් කළණ මල්ශික මඩවල, එන්ආර්එක්ස් 4518, ශ්‍රීලංනාහ;

*2025 පෙබරවාරි මස 19 වැනි දින සිට වැඩ බලන ලුතිනන් (සැ) වශයෙන් :*

උප ලුතිනන් (සැ) රත්නායක මුදියන්සේලාගේ අමිරු දුල්සර බණ්ඩාර රත්නායක, එන්ආර්එස් 4533, ශ්‍රීලංනාහ;

*2025 පෙබරවාරි මස 19 වැනි දින සිට වැඩ බලන ලුතිනන් (නාපාබල) වශයෙන් :*

උප ලුතිනන් (නාපාබල) දියගු බඩතුරුගේ විනුර දුලන්ජිත් කලනසිරි, එන්ආර්අයි 4538, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 11 වැනි දින සිට වැඩ බලන ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් අධිකාරි මුදියන්සේලාගේ කසුන් සංජය මධුමාධව අධිකාරි, එන්ආර්එක්ස් 4552, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 11 වැනි දින සිට වැඩ බලන ලුතිනන් (නීති) වශයෙන් :*

උප ලුතිනන් (නීති) දූෂාන් රන්ශිබ මුදලිගම, එන්ආර්ජ් 4598, ශ්‍රීලංනාහ;

*2022 නොවැම්බර් මස 24 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් සේනානායක රාලලාගේ මොදිත ඕවින්ද සේනානායක, එන්ආර්ඩී 4030, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් බෝදා හැන්නදිගේ මොන්ටි ජයනාත් සඳරුවන් ද සිල්වා, එන්ආර්ඩී 4492, ශ්‍රීලංනාහ;

*2024 පෙබරවාරි මස 19 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් වීරකෝන් වලව්වේ රජිත කසුන් බංඩාර වීරකෝන්, එන්ආර්එක්ස් 4495, ශ්‍රීලංනාහ;

*2024 පෙබරවාරි මස 19 වැනි දින සිට උප ලුතිනන් (ඉ) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (ඉ) හෙට්ටියාදුර පිලිප් රෂේන් සංදීප ප්‍රනාන්දු, එන්ආර්ඊ 4526, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 28 වැනි දින සිට උප ලුතිනන් (විආ) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (විආ) මුනසිංගේ උදාර සම්පත් කුමාර, එන්ආර්ආර් 4618, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (විආ) කාරියවසම් සචිත් ෂෙහාන් අමරසේන, එන්ආර්ආර් 4623, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 28 වැනි දින සිට උප ලුතිනන් (මැරීන්) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (මැරීන්) හේවා ඇල්ලවෙලගේ මලිඳු ශානක, එන්ආර්වයි 4622, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 28 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් මාතොටගේ චාමික ජයදේව, එන්ආර්එක්ස් 4624, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් ඩිනාල් උවින් මේලක සේරසිංහ, එන්ආර්එක්ස් 4628, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් කළුබෝවිලගේ නුවිණු තිවංක පෙරේරා, එන්ආර්එක්ස් 4630, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් හේවාබරණගේ රසිත ලක්ෂාන් පෙරේරා, එන්ආර්එක්ස් 4631, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ යසාන් කල්මිත් රත්නායක, එන්ආර්එක්ස් 4637, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් හංසන ප්‍රමෝද් ලොකුබෝගහවත්ත, එන්ආර්එක්ස් 4638, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් චතුදූර මලින්ද ඩිල්ෂාන්, එන්ආර්එක්ස් 4639, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් උඩුගම විජේතුංග ආරච්චිගේ ජනිදු තාරුක විජේතුංග, එන්ආර්එක්ස් 4649, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 28 වැනි දින සිට උප ලුතිනන් (සැ) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (සැ) මුදියන්සේලාගේ දොන් නිතිල ලක්විදු ඉලුක්පිටිය, එන්ආර්එස් 4626, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (සැ) උඩවත්ත අප්පුහාමිලාගේ දොන් විශ්ව සහන් සමරසේකර, එන්ආර්එස් 4642, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 28 වැනි දින සිට උප ලුතිනන් (නාපාබල) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) අබේසිංහ මුදියන්සේලාගේ එරංග දේශාන් සෙනෙවිරත්න, එන්ආර්අයි 4632, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) අබේසිංහ මුදියන්සේලාගේ මධුසංඛ නවරත්න, එන්ආර්අයි 4633, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) අතාවුද මුදියන්සේලාගේ ශෂින්ත ඩිල්ෂාන් දිසානායක, එන්ආර්අයි 4634, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) කුජන අභිෂේක් කුලතුංග, එන්ආර්අයි 4640, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) මහදූර ගීත් ජයසේකර, එන්ආර්අයි 4643, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) වැව්ට විදානලාගේ දොන් අවිශ්ක දිල්ෂාන් වැව්ට, එන්ආර්අයි 4645, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) ආකිල් හසීම්, එන්ආර්අයි 4646, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) වන්නිනායක මුදියන්සේලාගේ පුබුදු චතුරංග බණ්ඩාර එරියාව, එන්ආර්අයි 4647, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) ජයසුන්දර හේරත් මුදියන්සේලාගේ ගිහාන් දුලංජය ජයසුන්දර, එන්ආර්අයි 4648, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) කෝන්ගහගෙදර සජිත් රොනල්ඩ්, එන්ආර්අයි 4650, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) රාජසිංහගේ සවිත්‍ර චමෝද් සඳරු මුණසිංහ, එන්ආර්අයි 4651, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) මීවල ආරච්චිලාගේ අවිෂ්ක නිපුන් සඳරුවන්, එන්ආර්අයි 4654, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) වික්‍රමසිංහ සේනානායක නිමෙත් සන්දිනු, එන්ආර්අයි 4655, ශ්‍රීලංනාහ;

*2025 අප්‍රේල් මස 18 වැනි දින සිට උප ලුතිනන් (සැ) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (සැ) බිංදුහේවා දිලිත නිවින් ද සිල්වා, එන්ආර්එස් 4664, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (සැ) සුබද්දා කංකානමලාගේ නදුන් නිවංක සුරේඥ, එන්ආර්එස් 4680, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (සැ) ලොකු බාලසූරියගේ අමිත් ක්‍රිෂාන් උදයශාන්ත, එන්ආර්එස් 4681, ශ්‍රීලංනාහ;

*2025 අප්‍රේල් මස 18 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් වෙනුජ රන්දින ගනේගොඩ, එන්ආර්එක්ස් 4673, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් අන්නදොරේ ප්‍රියදර්ශන්, එන්ආර්එක්ස් 4687, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් හිටිහාමි මුදියන්සේලාගේ විශ්මිත නේරංජන ගුණරත්න, එන්ආර්එක්ස් 4688, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් ළහිරු කුමාර ගමගේ, එන්ආර්එක්ස් 4691, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් විජේසිංහ තිමිර චානුක, එන්ආර්එක්ස් 4694, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් රාජමන්ත්‍රි ඉසුරු භානුක රාජමන්ත්‍රි, එන්ආර්එක්ස් 4696, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් ධනපාල මුදියාන්සේලාගේ සමිත මධුශංක ධනපාල, එන්ආර්එක්ස් 4698, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් හේවා ගමගේ ලසිඳු නිම්සර, එන්ආර්එක්ස් 4700, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් වත්තේ ගෙදර රවිඳු ලක්ශාන් බණ්ඩාර, එන්ආර්එක්ස් 4701, ශ්‍රීලංනාහ;

*2025 අප්‍රේල් මස 18 වැනි දින සිට උප ලුතිනන් (නාපාබල) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) දියගු ආරච්චිගේ චමෝද් විමුක්ති ගුණවර්ධන, එන්ආර්අයි 4677, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) එදිරවීර ආරච්චිගේ කවීෂ ගිම්හාන් එදිරිවීර, එන්ආර්අයි 4682, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) ගමගේ විසල් දුල්සර, එන්ආර්අයි 4689, ශ්‍රීලංනාහ.

බීඒකේඑස්පී බානගොඩ,
ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2025 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 146

## රජයේ නිවේදන

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉඹුල්පෙ

උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ වාර්ෂික
මහා පෙරහැර - 2025

**පෙරහැර පවත්වන කාල සීමාව :**

1. 2025 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2025.07.26 දින සුභ මොහොතින් සිදු කරන ලදී:

   - 2025.09.22 වැනි දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව ද ;
   - 2025.09.24 වැනි දින සිට 2025.09.28 වැනි දින දක්වා උඩමළුවේ පෙරහැර ද ;
   - 2025.09.29 වැනි දින සිට 2025.10.03 වැනි දින දක්වා දෙවෙලේ පෙරහැර ද ;
   - 2025.10.04 වැනි දින සිට 2025.10.08 වැනි දින දක්වා මහා පෙරහැර ද ;
   - 2025.10.07 වැනි දින ගිනි පෑගීම ද ;
   - 2025.10.09 වැනි දින උදෑසන යෙදෙන සුබ මොහොතින් දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිත ය.

**කඳවුරු ප්‍රදේශය යනු :**

2. දේවාල භූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස හා බටහිර පෙදෙසවන පිරිත්වත්ත, ගල්වත්ත, මළුකාරවත්ත හා උතුරු දෙසින් පිහිටි උඩහගෙදරවත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමිභාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

**ආහාර හා ජලය :**

3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍යය මළුව, දේවාලය අවට පහත මාලය, කලායතන රථගෙය, මැදවත්ත හා ඒ අවට ප්‍රදේශ තුළ ආහාර පිසීම තහනම් කෙරේ.

4. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානවල නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර අවසරලත් අය හැර සතුනට ආහාර සැපයීම නොකළ යුතු ය.

5. පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුළ අවශ්‍ය පානීය ජලය හා අමතර ජල ටැංකි යොදා පහසුකම් සැපයීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

**වෙළෙඳාම හා ගොඩනැඟිලි ඉදිකිරීම :**

6. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශ තුළ මල්, සුවඳ ද්‍රව්‍ය, ඉටිපන්දම් හා භාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම් ය.

7. ඉහත අංක 02 වගන්තියෙහි සඳහන් භූමිය තුළ හෝ වෙනත් කිසිම ස්ථානයක වෙළෙඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

8. පෙරහැර මංගල්‍යය පවත්වන දිනවල, සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන මවිසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළෙඳසැල්වල හැර අනෙකුත් ස්ථානවල වෙළඳාම් කටයුතු සිදු කිරීම තහනම් ය.

9. ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලයලත් නිලධාරියකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාලසීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

10. මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අනවසර වෙළඳාම් කටයුතු තහනම් වේ.

**වාහන :**

11. පෙරහැර පැවැත්වෙන කාලසීමාව තුළ උත්සව භූමියට වාහන ඇතුළු කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර ඇති වාහනවලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ගවල වාහන ගමනාගමනයට ඉඩ දෙනු නොලැබේ.

- කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් අලුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මංසන්ධියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.
- තොටපල්ල, පොකුණේගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.
- පිරිත්වත්ත, ගල්වත්ත ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.

12. ප්‍රධාන මාර්ගයේ පෞද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන කඳවුරු භූමිය තුළට ඇතුළු කිරීම තහනම් ය.

**ඡායාරූප ගැනීම :**

13. දේවාලයේ දික් ගෙය, මාලිගාවේ ඉහළ මාලය, ඡායාරූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදු කිරීම සපුරා තහනම් කෙරේ.

**විදුලිය පහසුකම් :**

14. දේවාල භූමිය හා අවට මාර්ගයේ වීදි ලාම්පු හා අමතර ලාම්පු සවි කිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

**සෞඛ්‍ය පහසුකම් :**

15. පෙරහැර මංගල්‍යයට පෙර හා පසු සෞඛ්‍ය, සනීපාරක්ෂක කටයුතු, ඩෙංගු මර්දන කටයුතු හා අපද්‍රව්‍ය ඉවත් කිරීම ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හා සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

16. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසියම් තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ බලපවත්වන වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතු ය

**යාචකයෝ :**

11. සිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමිය තුළ හෝ, කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

**ආරක්ෂාව :**

18. සියලු ආරක්ෂක කටයුතු, පෙරහැරට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරමි.

**වෙනත් :**

19. රතිඤ්ඤා, වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

09 - 139

**අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

වන්දනා ගමන් ආඥාපනත

**ගොඩපිටිය මුස්ලිම් ආගමික උත්සවය - 2025**

මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩපිටිය පෝරුවේ (අකුරැස්ස ගොඩපිටිය) මුහියද්දීන් මුස්ලිම් දේවස්ථානයේ වාර්ෂික ආගමික උත්සවය **2025 සැප්තැම්බර් මස 25 වැනි දින ආරම්භ වී 2025 ඔක්තෝබර් මස 05 වැනි දින** අවසන් කරන බව (175 අධිකාරිය) වන්දනා ආඥාපනත යටතේ සකස්කර, 1954 ජනවාරි මස 08 වැනි දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රෙගුලාසිවල 3 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1954 ජනවාරි මස 08 වැනි දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉහත පැවැත්වෙන කාලය තුළ දී එකී රෙගුලාසිවල සඳහන් එහිම ඡේදයෙන් විස්තරවන නියෝග කඳවුර තුළ ක්‍රියාත්මක වේ.

නිරෝෂා එස්. ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

09 - 200

---

**ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව**

1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධිත පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1)26(1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුභාෂිණී දයානන්ද,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2025 සැප්තැම්බර් මස 10 වැනි දින.
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

**උපලේඛනය**

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 46753 | කාරියවසම්ගේ ඉන්දික උදයකුමාර මයා, කිරිබත්ගල, වටාපත, නිවිතිගල. | සෙව්වන්දලාගේ සුජීතා ප්‍රියංගනී, අංක 99, බලංගොඩ පාර, පැල්මඩුල්ල. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (02)<br>46721 | හුසේන් නිරෝෂා ෂෙරීක් මිය,<br>අංක 71/19/D, ගෝතමී මාවත, වෙලේවත්ත, වැල්ලම්පිටිය. | ඉදිරිමුනි වින්සන් මෙන්ඩිස් මයා,<br>අංක 165, මෙගොඩ කොලොන්නාව, වැල්ලම්පිටිය. |
| (03)<br>46726 | සියඹලාපිටියගේ තුෂාරි ප්‍රියදර්ශනි පෙරේරා මිය,<br>අංක 08, රණවිරු ආරියරත්න මාවත,<br>දකුණු තල්පිටිය, වාද්දුව. | දූරගේ ආරියදාස ප්‍රනාන්දු මයා,<br>අංක 5/43, දළදාවත්ත පාර, දකුණු තල්පිටිය, වාද්දුව. |
| (04)<br>44849 | හේවා ගමගේ දෝන සුනේත්‍රා මල්කා,<br>අංක 188/11,<br>පහල හංවැල්ල, හංවැල්ල.<br>ඇටෝර්නි බලකරු - වගුරේ ගමරාලලාගේ ප්‍රේමසිරි<br>ණයකරුගේ උරුමකරුවන් - වගුරේ ගමරාලලාගේ ප්‍රේමසිරි<br>02. සෝදිගේ සෝමාවති *හෙවත්* සෝදිගේ ජයවතී<br>03. හේවා ගමගේ දෝන මංජුලා දිල්රුක්ෂි<br>04. හේවා ගමගේ දෝන ධම්මිකා ජයශාන්ති මිය. | කංකානමලාගේ ප්‍රදීප් නිලංග රණසිංහ මයා,<br>අංක 277, ආටිගල, හංවැල්ල. |
| (05)<br>GAM 110 | සමරසේකර ඔකඳපොල ආරච්චිගේ ඩේසි අනෝමා සමරසේකර මිය,<br>අංක 180, ලාවළුපිටිය, වතුරුගම. | අමරසිංහ ආරච්චිගේ දේවප්‍රිය අමරසිංහ මයා,<br>අංක 155/1, වරපලාන, උඩුතුත්තිරිපිටිය,<br>ඇටෝර්නි බලකරු -<br>එච්. ශිරාන් චමින්ද පෙරේරා මිය. |
| (06)<br>45245 | ජාගොඩවත්ත ආරච්චිගේ කිත්සිරි චන්ද්‍රානන්ද මයා,<br>අංක 255, ඉහළ බියන්විල, කඩවත. | අතුකෝරලලාගේ දොන් විමලසේන විජේතුංග මයා,<br>අංක 4/1, බෝධිය පාර, ඇඹුල්දෙනිය, උඩහමුල්ල, නුගේගොඩ. |
| (07)<br>GAM 506 | ජයලත් ආරච්චිගේ නිව්ටන් ජෝෂප් (මියගොස්)<br>01. ගාරදි හේවාගමගේ ධම්මිකා ප්‍රියන්ති මිය<br>02. ජයලත් ආරච්චිගේ අමිත් ප්‍රිමාල් රංගන<br>03. ජයලත් ආරච්චිගේ අමන්ති ඉරේෂිකා මධුෂානි මිය<br>04. ජයලත් ආරච්චිගේ අසිත් ශ්‍රීමාල් ධනංජන<br>අංක 254, තල්ගස්කොටුව, කටාන. | ජයමහ මුදලිගේ දෝන දිස්නා සජීවනී,<br>අංක 190/7, සාන්ත ජෝෂප් වීදිය, මීගමුව. |
| (08)<br>GAM 507 | බ්‍රෙසියා ග්‍රාමීන් (pvt) ලිමිටඩ් ආයතනය<br>සියගුණ කොස්ගොඩගේ මහේෂ් පරාක්‍රම ප්‍රනාන්දු<br>අන්නක්කරගේ ක්‍රිෂෝජ් මැල්කන් පීරිස්<br>තේනගේ තනුජා සම්පත් ප්‍රනාන්දු මිය<br>අංක 88/2, හලාවත පාර, කට්ටුව, මීගමුව. | කළුදේවයලාගෙදර ඉන්ද්‍රා මාලනී මිය,<br>අංක 163/30, බංගලාවත්ත, කිරිල්ලවල. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (09)<br>GAM 519 | තැඹිලියන ආරච්චිලාගේ සුසිල් තිලකරත්න මයා,<br>අංක 284/D/2/2,<br>ඉහළ යාගොඩ, ඉඹුල්ගොඩ. | දේවනාරායන ආභරණ ගෙදර ලලිත් රණතුංග මයා,<br>අංක 284/D, ඉහළ යාගොඩ, ඉඹුල්ගොඩ. |
| (10)<br>GAM 525 | ඇතුගල් පේඩිගේ රත්න ජීවනී ගමගේවත්ත මිය,<br>බටකන්ද, බඩල්ගම. | ජයකොඩි ආරච්චිලාගේ සුරේෂ් සම්පත් මයා,<br>යහළගොඩැල්ල, ගොඩිගමුව, බඩල්ගම. |
| (11)<br>KU 110 | ඉලයතම්බි සොරත අලගු,<br>අංක 210, තිස්සෝගම, ඉලිප්පදෙනිය,<br>හලාවත. | මල්ලවතන්ත්‍රිගේ නිශාන්ත පෙරේරා මයා,<br>අංක 472/06/ඒ,<br>මාකොළ උතුර, බියගම. |
| (12)<br>45302 | මංගලගම මනමේන්ද්‍ර ගෙදර සෙනෙවිරත්න,<br>අංක 222/A, මංගලගම, මුරුතලාව. | ඌරපොල වෙදගෙදර රත්න තිලකාවතී මිය,<br>අංක 291/C, ගුරුගම, මුරුතලාව. |
| (13)<br>KU 364 | දිනමිත්‍ර ගෙදර විජේසුන්දර මයා,<br>අංක 56,<br>මක්කානිගද, දෙවටපාර, මක්කානීගම. | දෙහිමඩුවේ ගෙදර අජිත් කුමාර ද සිල්වා මයා,<br>අංක 623, විජයශ්‍රීගම, රජවැල්ල. |
| (14)<br>45277 | ජයසූරිය ආරච්චිගේ ශ්‍රියානි දේවිකා මිය,<br>බී ජී විද්‍යාරත්න ගමගේ බාරේ,<br>අංක 95, මෛත්‍රී උයන, කන්ජුක්කුලිය,<br>මුකුණුවටවන. | ගලිසපිටිගේ හිල්ඩා රංජනී,<br>අංක 100, මෛත්‍රී උයන,<br>කන්ජුක්කුලිය, මුකුණුවටවන. |
| (15)<br>KU 171 | රන්පටින් ගෙදර නෙත්මි දෙව්මිණි මිය,<br>අංක 88/16, ඉහළ බෝමිරිය, කඩුවෙල. | බරින් ඩේන්,<br>අංක 182, නාගස්තලාව, දමනේවල. |
| (16)<br>45042 | හපුවා දූරලයාගේ ගෙදර ගුණතුංග මයා,<br>අංක 280, දලුපොත, රත්මල්ල, කටුපොත. | හපුවා දූරලයාගේ ඉරේෂා රත්නකුමාරි මිය,<br>දලුපොත, රත්මල්ල, කටුපොත. |
| (17)<br>KU 453 | හඳපාන්ගොඩ මුදලිගේ ගීතා හඳපාන්ගොඩ මිය,<br>අංක 116/2, දේවාල පාර, පත්තඩුවන,<br>මැල්ලගොඩැල්ල, මිනුවන්ගොඩ. | සුහසිංහ අප්පුහාමිල්ලාගේ නිරෝෂන් මධුසංඛ සුහසිංහ මයා,<br>යක්කන්නැහැර, දීකිරිවැව. |
| (18)<br>KU 508 | දූල්වල ගෙදර පියදාස මයා,<br>අංක 88, දොරනෑගම පාර, මැදවල,<br>හාරිස්පත්තුව. | පහළ ගෙදර සන්ද්‍යා කුමාරි තිලකරත්න මිය,<br>අංක 175, නව නගරය, දිගන, රජවැල්ල. |
| (19)<br>KU 386 | සිරිවැඩි නයිදෙලාගේ කල්‍යාණි ගුණරත්න,<br>අංක 417/03,<br>ශාන්ත රීටා මාවත, දළුව, කොටුව. | ඉදිප්පුලි මුදියන්සේලාගේ සමන්තා ප්‍රියංගනී මිය,<br>අංක 21/1, සිත්මිණි, ඉරට්ටකුලම, මාදම්පේ. |
| (20)<br>46691 | තෙන්නකෝන් මුදියන්සේලාගේ සකුන්තලා කුමාරි තෙන්නකෝන් මිය,<br>අංක 09, කහගොල්ල, දියතලාව. | හිත්තිටියේ එදිරිසූරියගේ පියචින්තිකා සමන්ති මිය,<br>අංක 07, බී, ජලාශය පාර, බණ්ඩාරවෙල. |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (21) 46690 | තෙන්නකෝන් මුදියන්සේලාගේ සකුන්තලා කුමාරි තෙන්නකෝන් මිය, අංක 09, කහගොල්ල, දියතලාව. | හිත්තටියේ එදිරිසූරියගේ පියචින්තිකා සමන්ති මිය, අංක 07 බී, ජලාශය පාර, බණ්ඩාරවෙල. |

09 - 208

---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

**ඉඩම් මැනුම් සභාව**

47 (1) (ඇ) වගන්තිය යටතේ වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවා ඇති මිනින්දෝරුවරුන්ගේ නාමලේඛනය

| ලියාපදිංචි අංකය | සම්පූර්ණ නම | ලියාපදිංචිය අවලංගු කරන ලද කාලය |
|---|---|---|
| 20040955 | උඩුමලගල කනත්ත ගමගේ ප්‍රසාද් සුසන්ත පුෂ්පකුමාර | 2025.07.22 දින සිට 2025.10.21 දින දක්වා |

වයි. ජී. ඥානතිලක,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

09-214

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

හිරාන් පවර් පනාමුරේ (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0043 1000 1711.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. අයි. උදයංගනී විසින් ලියා සහතික කරන ලද 2019 සැප්තැම්බර් මස 06 දාතම හා අංක 2409 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 9100 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක්වන හිරාන් පවර් පනාමුරේ (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක 2950 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන හිරාන් පවර් පනාමුරේ (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු

වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2409 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහ හතර කෝටි දාහත් ලක්ෂ තිස් දහස් හාරසිය හැත්තෑ පහයි ශත පනස් හතක (රු. 141,730,475.57) මුදලක් 2025 අප්‍රේල් මස 06 දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහ හතර කෝටි දාහත් ලක්ෂ තිස් දහස් හාරසිය හැත්තෑ පහයි ශත පනස් හතක (රු. 141,730,475.57) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 2409 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් කෝටි අනූ අට ලක්ෂ හැට හය දහස් හත්සිය දොළහක (රු. 79,866,712.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Two Decimal Naught *per centum* (AWPLR+ 2.0% p.a.) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2950 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. (*a*) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තලවතුහේන්පිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දළුගම උප කාර්යාල සීමාවන් තුළ තලවතුහේන්පිට පිහිටි "කලමඩුවගහකුඹුර" යයි කියනු ලබන කුඹුරට (බලයලත් මානක තැන රත්න හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1983 පෙබරවාරි මස 06 දාතම හා අංක 25/1983 දරන පිඹුරේ නිරූපිත කුඹුරේ කොටසක් වන) බලයලත් මානක තැන පී. ජයකොඩි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 23 දාතම හා අංක 6040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නුවර පාර සහ ලොට් B; නැගෙනහිරට : ලොට් B; දකුණට : ලොට් C සහ බස්නාහිරට : ඇළ සහ නුවර පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (P:10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6040 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 123/121 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(*b*) එකී තලවතුහේන්පිට පිහිටි "කලමඩුවගහකුඹුර" යයි කියනු ලබන කුඹුරට (බලයලත් මානක තැන රත්න හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1983 පෙබරවාරි මස 06 දාතම හා අංක 25/1983 දරන පිඹුරේ නිරූපිත කුඹුරේ කොටසක්වන) බලයලත් මානක තැන පී. ජයකොඩි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 23 දාතම හා අංක 6040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නුවර පාර සහ අංක 106/1980 දරන පිඹුරේ ලොට් D හි ඉතිරි කොටස; නැගෙනහිරට : අංක 106/1980 දරන පිඹුරේ ලොට් D හි ඉතිරි කොටස, එන්. ඩී. සීලවති හාමිනේට අයිති කුඹුර සහ ලොට් C; දකුණට : එන්. ඩී. සීලවති හාමිනේට අයිති කුඹුර සහ ලොට් C සහ ලොට් A සහ බස්නාහිරට : ලොට් A සහ නුවර පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (R:1) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6040 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 123/122 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(*c*) එකී තලවතුහේන්පිට පිහිටි "කලමඩුවගහකුඹුර" යයි කියනු ලබන කුඹුරට (රත්න හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1983 පෙබරවාරි 06 දාතම හා අංක 25/1983 දරන පිඹුරේ නිරූපිත කුඹුරේ කොටසක්වන) බලයලත් මානක තැන පී. ජයකොඩි යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 23 දාතම හා අංක 6040 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් C වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් A සහ ලොට් B සහ ඊ. ඒ. ඒ. එදිරිසිංහට අයිති කුඹුර; නැගෙනහිරට : එන්. ඩී. සීලවති හාමිනේට සහ ඊ. ඒ. ඒ. එදිරිසිංහට අයිති කුඹුරු, ඇළ සහ පන්සල අයිති ඉඩම; දකුණට : කුඹුර (T P 207358) සහ ඇළ සහ බස්නාහිරට : ඇළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසි පහක් (A:1, R:3, P:25) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6040 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 123/123 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හැව්ලොක් ටවුන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැව්ලොක් ටවුන්, වෝඩ් අංක 5 පිහිටි තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 140 දරන ඉඩමට බලයලත් මානක තැන එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින්

සාදන ලද 2004 ජනවාරි මස 21 දාතම හා අංක 2785 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : තිඹිරිගස්යාය පාර; නැගෙනහිරට : අඩි පාර; දකුණට : තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 142/33 සහ 138 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පුද්ගලික පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම පහයි බිංදුවක් (P:26.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2785 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව E 216/97 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2785 දරන එකී පිඹුරේ එකී ලොට් 01 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ හැව්ලොක් ටවුන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැව්ලොක් ටවුන්, වෝඩ් අංක 5 පිහිටි තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 140 දරන ඉඩමට බලයලත් මානක තැන ඒ. ආර්. ඩයස් අබයගුණවර්ධන විසින් සාදන ලද 1979 මාර්තු මස 27 දාතම හා අංක 2794 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : තිඹිරිගස්යාය පාර; නැගෙනහිරට: අඩි පාර; දකුණට : තිඹිරිගස්යාය පාර, වරිපනම් අංක 142/33 සහ 138 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පුද්ගලික පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම පහයි බිංදුවක් (P: 26.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2794 දරන පිඹුරට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09 - 188

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ඕක්ලන්ඩ් ඔටෝ ස්පෙයාර්ස්
ගිණුම් අංකය : 0010 1001 1503

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඩබ්ලිව්. එස්. පරණමාන විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 10 දාතම හා අංක 3862 සහ 3864 දරන උකස් බැඳුම්කර දෙක සහ ඩබ්ලිව්. එල්. අයි. ප්‍රියදර්ශනී විසින් ලියා සහතික කරන ලද 2022 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 771 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ " ඕක්ලන්ඩ් ඔටෝ ස්පෙයාර්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරුවන ලෙල්වල ලොකුගේ සුජිත් රොෂාන්ත බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 3862, 3864 සහ 771 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන් කෝටි දහසය ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය අනූ දෙකයි ශත හැට හතරක (රු. 51,674,192.64) මුදලක් 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී අංක 3862, 3864 සහ 771 දරන උකස් බැඳුම්කර, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන් කෝටි දහසය ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය අනූ දෙකයි ශත හැට හතරක (රු. 51,674,192.64) මුදල ද 2025 අප්‍රේල් මස 07 වැනි දින සිට එකී අංක 3862, 3864 සහ 771 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි තිස් ලක්ෂ අසූ දහසක (රු. 43,080,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 3862, 3864 සහ 771 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ

ලේකම් කාර්යාල කොට්ඨාසයේ, යකබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ යකබැද්ද පිහිටි "පරණවත්ත හි ලොට් 2 හි ලොට් B සහ වලව්වේවත්ත හි ලොට් A හි ඒකාබද්ධය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2012.05.15 දාතම හා අංක 12/1022 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : උදාර මාවත සහ පරණවත්ත හි ලොට් C; නැගෙනහිරට: පරණවත්ත හි ලොට් C, වලව්වත්ත හි ලොට් 11 සහ ප්‍රධාන පාර; දකුණට: වලව්වත්ත හි ලොට් 12 හි කොටසක් (ආක්‍රමණය කිරීම) සහ බස්නාහිරට : පරණවත්ත හි ලොට් A සහ වලව්වත්ත හි ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයක් (පර්. 36) විශාල ඉඩම් කොටස එකී අංක 12/1022 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් X, බලයලත් මානක තැන එස්. ඒ. ගලප්පත්ති විසින් සාදන ලද 1973.04.22 දාතම හා අංක 22 දරන පිඹුරේ නිරූපිත ලොට් 12 (බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2012.06.04 දාතම හා අංක 12/1044 දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් දැන් දක්වා ඇති සහ නැවත මිනුම) සහ බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2007.08.27 දාතම හා අංක 07/055 දරන පිඹුරේ නිරූපිත ලොට් B (බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2012.06.04 දාතම හා අංක 12/1043 දරන පිඹුරේ නිරූපිත ලොට් B වශයෙන් දැන් දක්වා ඇති නැවත මිනුම) පහතින් දක්වා ඇති පරිදි ඒකාබද්ධයක් සහ නැවත මිනුමකි. එම නිසා එකී ලොට් X, පහතින් විස්තර කොට ඇති ඉඩම්වලට යාව වෙනම වෙළුමක/ පත්ඉරුවක නිසිලෙස ලියාපදිංචි කරන්න.

- දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, යකබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ යකබැද්ද පිහිටි "වලව්වේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2012.06.04 දාතම හා අංක 12/1044 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ ලොට් 13; නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 11 සහ ලොට් 10 (ප්‍රධාන පාරට පාර) ; දකුණට : මෙම ඉඩමේ ලොට් 12 හි කොටසක් (ආක්‍රමණය කිරීම) සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 12/1044 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, යකබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ යකබැද්ද පිහිටි "වලව්වේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඒ. ගලප්පත්ති විසින් සාදන ලද 1973.04.22 දාතම හා අංක 22 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 12 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ ලොට් 13; නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 11 සහ ලොට් 10 (ප්‍රධාන පාරට පාර) ; දකුණට : මෙම ඉඩමේ ලොට් 9, 8, 7 සහ 6 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 7 සහ 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම අටයි තුනක් (පර්. 21.83) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 22 දරන පිඹුරට අනුව යොමුව Q 27/115 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

- දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, යකබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ යකබැද්ද පිහිටි "පරණවත්ත හි ලොට් 2 හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2012.06.04 දාතම හා අංක 12/1043 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : උදාර මාවත; නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් C; දකුණට : වලව්වත්ත සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 12/1043 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් B පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, යකබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ යකබැද්ද පිහිටි "පරණවත්ත හි ලොට් 2 හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2007.08.27 දාතම හා අංක 07/055 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : උදාර මාවත; නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් C; දකුණට : වලව්වත්ත සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (පර්.18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 07/055 දරන පිඹුරට යොමුව Q 27/116 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3862 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අකුරැස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අකුරැස්ස පිහිටි මාතර පාර, වරිපනම් අංක 85, 85A, 85B, 85C, 85C/1 දරන "ඔකොට්ටුව හි ලොට් 3A හි ලොට් 3C සහ 3D හි යාබද ලොට් A, B, C සහ D හි ලොට් A සහ B සහ ඔකොට්ටුව හි ලොට් 3හි ලොට් 3B හි ඒකාබද්ධය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේවන්ත විසින් සාදන ලද 2016.04.26 දාතම හා අංක 16/1850 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගාල්ල සිට අකුරැස්ස දක්වා පාර (මා. සං. අ.) සහ මෙම ඉඩමේ ලොට් 1; නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 1; දකුණට: නිල්වලා ගඟ සහ අංක 13/1129 දරන පිඹුරේ ලොට් C (නිල්වලා ගඟ හි කොටසක්) සහ බස්නාහිරට : වැපත්වෙල ඇළ, අංක 13/1129 දරන පිඹුරේ ලොට් D (වැපත්වෙල ඇළ හි කොටසක්) සහ ගාල්ල සිට අකුරැස්ස දක්වා පාර (මා. සං. අ.) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකයි දශම හතයි බිංදුවක් (රූඩ්.1, පර්.1.70) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 16/1850 දරන පිඹුරට අනුව යොමුව Q 49/80 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3864 සහ 771 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09 - 189

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ඩිලක්ස් රූෆින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0133 1000 1311

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි විසින් ලියා සහතික කරන ලද 2016 ජනවාරි මස 25 දාතම හා අංක 1377 දරන, 2018 ජනවාරි මස 31 දාතම හා අංක 2228 දරන, 2018 ඔක්තෝබර් මස 22 දාතම හා අංක 3884 දරන, 2015 මාර්තු මස 27 දාතම හා අංක 773 දරන, 2017 ජනවාරි මස 31 දාතම හා අංක 2226 දරන, 2018 ඔක්තෝබර් මස 22 දාතම හා අංක 3882 දරන, 2018 ඔක්තෝබර් මස 22 දාතම හා අංක 3880 දරන, 2019 අගෝස්තු මස 19 දාතම හා අංක 4476 දරන සහ 2019 අගෝස්තු මස 19 දාතම හා අංක 4474 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 89880 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන ඩිලක්ස් රූෆින් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රණවන හේරත් වාසල මුදියන්සේලාගේ රාළහාමිලාගේ පල්ලේ වලව්වේ රුවන් ධම්මික බන්ඩාර රණවන *නොහොත්* රුවන් ධම්මික බන්ඩාර රණවන උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1377, 2228, 3884, 773, 2226, 3882, 3880, 4476 සහ 4474 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත් කෝටි හතළිස් නව ලක්ෂ පනස් එක් දහස් තුන්සිය හැත්තෑ දෙකයි ශත අසූ හතරක (රු. 74,951,372.84) මුදලක් 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී අංක 1377, 2228, 3884, 773, 2226, 3882, 3880, 4476 සහ 4474 දරන උකස් බැඳුම්කර, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත් කෝටි හතළිස් නව ලක්ෂ පනස් එක් දහස් තුන්සිය හැත්තෑ දෙකයි ශත අසූ හතරක (රු. 74,951,372.84) මුදල ද, 2025 අප්‍රේල් මස 07 වැනි දින සිට එකී අංක 1377, 2228, 3884, 773, 2226, 3882, 3880, 4476 සහ 4474 දරන උකස් බැඳුම්කර දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි පනස් නව ලක්ෂ පනස් එක් දහස් දෙසිය විසි තුනයි ශත පනස් නවයක (රු. 15,951,223.59)ක මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටයි දශම බිංදුවක් (18.0%) හා තවත් රුපියල් හාර කෝටි අට ලක්ෂයක (රු. 40,800,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම බිංදුවක් (12.0%) හා තවත් රුපියල් හැට පන් ලක්ෂ විසි දෙදහස් තුන්සිය පනස් එකයි ශත හතළිස් අටක (රු. 6,522,351.48) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනයි දශම බිංදුවක් (23.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1377, 2228, 3884, 773, 2226, 3882, 3880, 4476 සහ 4474 දරන

උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ හාරිස්පත්තු, උඩුගම්පහ, අකුරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අරඹේපොල, අංක 584 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අරඹේපොල පිහිටි "බංගලාවේ වත්ත *නොහොත්* අරඹේපොල වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ජී. වී. බී. ධර්මරත්න විසින් සාදන ලද 2015 නොවැම්බර් මස 15 දාතම හා අංක 2984 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1516 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 සහ ලොට් 03 වශයෙන් ලකුණු කොට ඇති පාර; නැගෙනහිරට : අංක 1516 දරන පිඹුරේ නිරූපිත ලොට් 04, පාර (මා. සං. අ.) සහ පිංග ඔය; දකුණට: අදේශ හාමිගේ වත්ත සහ කොරකහගල්ල හේන සහ බස්නාහිරට: හරස්ගම වලව්ව සහ ලොට් 02 සහ 03 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් විසි දෙකක් (A:2, R:3, P:22) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව R 68/143 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානකතැන ජී. වී. බී. ධර්මරත්න විසින් සාදන ලද 2015 නොවැම්බර් මස 15 දාතම හා අංක 2984 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 (පාර) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 1377, 2228 සහ 3884 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අරඹේපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ හාරිස්පත්තු, උඩුගම්පහ, අකුරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අරඹේපොල, අංක 584 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අරඹේපොල පිහිටි "බංගලාවේ වත්ත *නොහොත්* අරඹේපොල වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. වී. බී. ධර්මරත්න විසින් සාදන ලද 2009 අප්‍රේල් මස 25 දාතම හා අංක 1516 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 03 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 02 සහ ලොට් 01; නැගෙනහිරට : පාර (මා. සං. අ.); දකුණට : සිංඤෝ අප්පුගේ වත්ත සහ බස්නාහිරට : පිංග ඔය සහ ලොට් 04 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයයි දශම හතක් (R:2, P:6.7) හෝ හෙක්ටයාර 0.2192 විශාල ඉඩම් කොටස එකී අංක 1516 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව R 40/143 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 773, 2226 සහ 3882 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

3. (a) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ හාරිස්පත්තු, උඩුගම්පහ කෝරළේ, අකුරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අරඹේපොල, අංක 584 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අරඹේපොල ග්‍රාමයේ පිහිටි "නහපොලේ දෙබවේහේන *නොහොත්* නහපොල්ලේ දෙබේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. එස්. සංගරන්දෙණිය විසින් සාදන ලද 2018 මාර්තු මස 27 දාතම හා අංක 10861 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 03 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: අංකුඹුරට මහ පාර; නැගෙනහිරට : බන්ඩාරවත්ත වෙන්කෙරෙන කන්දේ කෙළවර; දකුණට : ලොට් 04 සහ බස්නාහිරට : අඩි 10 පිවිසුම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි අටයි දශම හතරක් (R:1, P:28.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව R 88/48 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(b) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ හාරිස්පත්තු, උඩුගම්පහ කෝරළේ, අකුරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අරඹේපොල, අංක 584 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අරඹේපොල ග්‍රාමයේ පිහිටි "නහපොලේ දෙබවේහේන *නොහොත්* නහපොල්ලේ දෙබේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ටී. බී. එස්. සංගරන්දෙණිය විසින් සාදන ලද 2018 මාර්තු මස 27 දාතම හා අංක 10861 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 05 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට

මායිම් : උතුරට : ලොට් 01, 04 සහ පාර; නැගෙනහිරට : බන්ඩාරවත්ත වෙන්කෙරෙන කන්දේ කෙළවර; දකුණට: ගල්කුඹුරේහේන වත්ත සහ බස්නාහිරට : ඩබ්ලිව්. පුංචිරාලට අයිති උඩහකොරටුව යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහක් (P:12.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිකාව R 88/49 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3880 සහ 4476 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

4. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ පාත දුම්බර උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඉහළවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කෙන්ගල්ල ග්‍රාමයේ පිහිටි "කොලොංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන පී. ජයන්ත අමරසේන විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 28 දාතම හා අංක 862 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : කොලොන්ගහවත්ත වෙන් කෙරෙන කම්බි වැට සහ පැල ඉණිවැට; ගිණිකොනට : කොලොන්ගහවත්ත වෙන් කෙරෙන කම්බි වැට සහ පැල ඉණිවැට සහ කොලුගල විසින් හිමිකම් කියන බලයලත් මානකතැන කේ. එච්. එම්. නවරත්න විසින් සාදන ලද අංක 4102 දරන පිඹුරේ ලොට් 07; නිරිතට : ගලිඉන්දවත්ත සිට මහ පාරට දිවෙන පාර සහ බලයලත් මානකතැන පී. ජයන්ත අමරසේන විසින් සාදන ලද අංක 603 දරන පිඹුරේ ලොට් 01 හි ඉතිරි කොටස සහ වයඹට : බී. රඹුක්වැල්ල විසින් හිමිකම් කියන කොලොන්ගහවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විසි පහක් (R:2, P:25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිකාව D 192/129 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4474 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09 - 190

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ජා ඇල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : සුසිල් කුමාර වික්‍රමරත්නායක

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2025.04.30 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී සුසිල් කුමාර වික්‍රමරත්නායක යන අය "බන්ධනදායී/ උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. තුෂාරි සිල්වා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2024.05.07 දිනැති අංක 1286 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 1286 දරන උකස්කරය මත, වර්ෂ 2024.12.26 දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු, රුපියල් දොළොස් මිලියන එක් ලක්ෂ හතළිස් දහස් පනස් එකයි ශත හැට හතරක (රු. 12,140,051.64) මුදලක් ද, වර්ෂ 2024.12.27 වැනි දින සිට රු. 11,693,679.71 ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 16.5% ක පොළිය ද, ඉහත කී බන්ධනදායී/ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත්, ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු එකී මුළු මුදල වන රුපියල් දොළොස් මිලියන එක් ලක්ෂ හතළිස් දහස් පනස් එකයි ශත හැට හතරක (රු. 12,140,051.64) ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන

වගන්තිය ප්‍රකාරව අංක 50/3, විහාර මාවත, කොලොන්නාව දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

